



# මොනවද මේ ස්වයංජාත වී



**වයි. එම්. සී. කේ. හේරත් - කෘෂිකර්ම උපදේශක**
**1920 ගොවි සහන සරණ සේවය,**
**ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය,**
**ගන්නෝරුව**

---

ස්වයංජාත වී පිළිබඳව වැඩිපුර කතාබහට ලක් වෙමින් පවතින අතර විවිධ ප්‍රදේශවල වගා කරන බවද මෑතක සිට අසන්නට ලැබේ.

1920 ගොවි සහන සරණ සේවයට ද මේ පිළිබඳව දුරකථන ඇමතුම් ලැබෙන බැවින් ස්වයංජාත වී යනු මොනවාදැයි හැඳින්වීමට අදහස් කරමි.

වී බෝගය හා සැසඳීමේ දී මෙම බෝග දෙකම තෘණ කුලයට අයත් වේ. නමුත් ස්වයංජාත ඇල් වී, වී වර්ගයක් නොව සෝගම් වර්ගයක්



ලෙස හඳුනාගෙන ඇත. මේ පිළිබඳ කතිකා වන්නේ මෙය වී වර්ගයක් බවත් වගා කිරීම පහසු බවත් නිසාය. ගෙවත්තක එක් ගසක් හෝ තිබේ නම් නිවසට සිරිකත කැන්දන බවට පැරැන්නන් අතර විශ්වාසයක් ද පවතී. ස්වයංජාත වී, ස්වයංජාත ඇල් සහල් නමින්ද හැඳින්වේ. මෙහි සුදු ඇල් සහල් හා රතු ඇල් සහල් ලෙස වර්ග දෙකකි.

අනාදිමත් කාලයේ සිට වියළි කලාපයේ හේන් වල වගා කර ඇති මෙම ස්වයංජාත ඇල් වී කුඹුරු වල වගා කිරීමේ අවදානමක් ඇති බව පැවසේ. එයට හේතුව ජලය ලැබීමත් සමඟ මෙම බෝගය කහ පැහැ ගැන්වීමයි. එම නිසා ගොඩබිම වගා කෙරේ.

මෙහි බීජ පෝෂණ ගුණය අතින් ඉහළය. කාබෝහයිඩ්‍රේට්, ඛනිජ ලවණ, ප්‍රෝටීන්, විටමින් අඩංගුය. කුඩා දරුවන්ට ගුණදායක බව පැවසේ. දිවයිනේ විවිධ ප්‍රදේශ වල ගෙවතු වගාවන් වල වගා කෙරෙමින් පවතී.

## ස්වයංජාත වී වල විශේෂ ලක්ෂණ

- එක් පඳුරක විවිධ වර්ධන අවස්ථාවේ ඇති පැළ දැක ගත හැකිය. වැඩීගෙන එන ලාබාල පැළයක්, අංග සම්පූර්ණ ලෙස පැසී මේරුණු ගසක්, භාගෙට පැසුණු කරල් සහිත ගසක් වැනි ලෙස.
- මෙම ශාක සාමාන්‍යයෙන් අඩි 10 ට වඩා උසකින් යුක්ත වේ.
- ඕනෑම කාලයක ඕනෑම ප්‍රදේශයක වගා කළ හැක.
- කරල් ශක්තිමත්ය.
- බීජ ඝනකම් පොතු වලින් ආවරණය වී නැත. කෙළින්ම කරලට සවි වී ඇත. රිකිලි කැපීමෙන් පසු නැවත නැවත කරල් සෑදේ.
- වසර 3 - 4 ක ජීව කාලයක් ඇත. ජීවිත කාලයටම එක ගසක් රිකිලි දමමින් වර්ධනය වෙමින් අස්වැන්න ලබා දේ.
- මාස 7 - 8 න් පළමු අස්වැන්න ලබා ගත හැකි අතර වාර්ෂිකව එක් පඳුරකින් කිලෝග්‍රෑම් 10 - 12 ක අස්වැන්නක් ලබා ගත හැක.
- කෘෂි රසායන, කෘෂිකාර්මික ක්‍රම, යන්ත්‍රෝපකරණ, හෝ විශේෂිත ලක්ෂණ සහිත භූමියක් අවශ්‍ය නොවේ.

## ස්වයංජාත පරිභෝජනයට සුදුසුද ?

- පිටත ආවරණය වී ඇති සියුම් පොත්ත අතින් පෑහීමෙන් හෝ වංගෙඩියට දමා කෙටීමෙන් පිරිසිදු කර ගත හැක.
- මෙතෙක් සනාථ වී ඇති කරුණු අනුව දේශීය ආහාර පාරිභෝජන රටාවට බාධාවක් වී නොමැත.